**අක්කරෙයිපත්තු මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මාරතු 31 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අගොස්තු 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තුව මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්
------------------------------------

පහත කරුණු නිරීක්ෂණවිය

(අ) එක් නිලධාරියෙකුට විදේශ ගමනක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු. 175,712 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 24,063 ක ණය ශේෂය සම්බන්ධයෙන් අදාල ආයතනවලින් අයකර ගැනීම සඳහා 2014 අප්‍රේල් 22 වන දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.3 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය අනුව වනාන්තර සහ ස්වභාවික සම්පත් අමාත්‍යංශයෙන් 2008 ජනවාරි 25 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 1553/16(11) දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ‘‘අ’’ කොටස | මහ නගර සභාවට අයත් ගවඝාතකාගාර සඳහා පරිසර සංරක්ෂණ බලපත්‍ර ලබා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු. රෙ. 571(2) | තැන්පත් කර වසර 02 ඉක්මවූ එකතු වටිනාකම රු. 7,336,860 ක්වූ තැන්පත් මුදල් 102 ක් සම්බන්ධයෙන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) මු. රෙ. 1646 | දෛනික ධාවන සටහන් අදාල මාසයෙන් පසු එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණනාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, වාහන 27 කට අදාල 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ ධාවන සටහන් 2014 අප්‍රේල් මස 20 වන දින දක්වා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) නැගෙනහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි අංක 477.2 | 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් පෙන්වා තිබූ ඌණතාවය වන කාර්යාල උපකරණ 12 සහ යන්ත්‍රෝපකරණ 05 ක් සම්බන්ධයෙන් කටයුතුකළ ආකාරය පිළිබඳ විගණනයට වාර්තා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 12,545,325 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 670,522 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 13,215,847 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
---------------------

2.2.1 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු
------------------------------------

පහත කරුණු නිරීක්ෂණවිය.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ මුදල වන රු. 843,950 ක මුදල නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු. 1,791,537 ක මුදල රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් විසින් ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 02 ක් සහ විදුලි සංදේශ ආයතනයන් විසින් ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුණු 04 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයකර ගතයුතු රු. 125,000 ක පමණ ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ආ) 2007 සිට 2012 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව හිග මස් කඩ බදු මුදල වන රු. 3,159,412 ක මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට 2014 අප්‍රේල් 22 දින දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ

(අ) 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකරගත් එකතුකල අගය මත බදු රු. 696,669 ක මුදල දේශිය ආදායම් කොමිසාරිස් ජනරාල් වරයා වෙතට ප්‍රේෂණය කිරීම සඳහා විගණන දිනය වන 2014 අප්‍රේල් 22 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවාසානය දක්වා මහ නගර සභාවේ මහජන පුස්තකාලයෙන් සාමාජිකයන් වෙත ලබා දී තිබූ රු. 6,601 ක වටිනා පොත් 52 ඔවුන්ගෙන් නැවත ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) මැතිවරණ රාජකාරි සඳහා සේවකයන් වෙත සභා අරමුදලින් ගෙවා තිබූ රු. 1,412 ක මුදල මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණ කරගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත කාල පරිච්ඡේදයේ පොළී ගෙවීම් ලෙස රු. 193,502 මුදල් ගෙවා තිබුනද එසඳහා අයවැය ප්‍රතිපාදන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි දක්වා ඇතත් සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය